# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
# (කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය)

**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් ස්ථිර තනතුරු සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**02.** <u>සහකාර සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරු – 01</u>

**A. බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -: (පහත සුදුසුකම් I හෝ II)**

I. මානව සම්පත් කළමනාකරණය / ව්‍යාපාර කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ වාණිජ්‍යවේදී යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක්

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

II. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ , පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**B. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -: (පහත සුදුසුකම් I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

II. **"කණිෂ්ඨ කළමනාකරණ"** (JM) සේවා ගණයේ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව** - : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය -:** 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව තනතුරට හිමි වැටුප් ප්‍රමාණය HM 1-1 2016 - රු. 53,175.00 – 10x1,375 – 15x1,910 - 95,575.00 ක් වේ.

**බඳවා ගැනීමේ දී වැටුප් තලය -:** රු. 53,175.00 වේ.

**වෙනත් දීමනා -:** රජය මඟින් අනුමත දීමනා හා පහසුකම් හිමි වේ.

මෙම තනතුරු ස්ථිර ය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය හිමි වේ. වසර තුනක පරිවාස කාලයකින් පසු ස්ථිර කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත තනතුර සඳහා බඳවාගනු ලැබේ.

ඔබගේ අයදුම්පත්‍රය **"සභාපති, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය, අංක 18, රාජගිරිය පාර, රාජගිරිය"**යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය වෙත 2023.12.13 දිනට පෙර ගෙනවිත් බාරදීම කළ යුතුය. දැනටමත් රාජ්‍ය අංශයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා මඟින් අයදුම් කළ යුතුයි. අයදුම්පත එවන ලිපි කවරයේ වම් ඉහළ කෙළවරෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුයි. වැඩිදුර තොරතුරු www.ssb.gov.lk වෙබ් අඩවිය තුළින් ලබාගත හැක.

**සභාපති,**
**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය,**
**"සමාජ ආරක්ෂණ පියස",**
**අංක 18, රාජගිරිය පාර,**
**රාජගිරිය.**
**2023.11.29**